ඇලෙක්සැන්ඩර් පුෂ්කින්

# මසුන් මරන්නා සහ රත්තරන් මාළුවා



පරිවර්තනය

දයාරත්න දළවැල්ල

ඇලෙක්සැන්ඩර් පුෂ්කින්

# මසුන් මරන්නා සහ රත්තරන් මාළුවා



පරිවර්තනය

දයාරත්න දළවැල්ල

මසුන් මරන්නා සහ රත්තරන් මාළුවා

© දයාරත්න දළවැල්ල

✆ 071 8376938

ප්‍රථම මුද්‍රණය - 2013

ISBN 978-955-591-271-6

අක්ෂර සංයෝජනය
ඩී. එච්. එල්. නිශාන්ත

චිත්‍ර
ව්ලැඩිමීර් කොනාෂෙවිච්

ප්‍රකාශනය

කුරුලු පොත් ප්‍රකාශකයෝ
594/1, නාවල පාර, රාජගිරිය.
දුර : 011 2863350/071 8263828

මුද්‍රණය
මධු ප්‍රින්ටින් වර්ක්ස්
71/බී නව නුවර පාර,
උඩුපිල- දෙල්ගොඩ.
071 2324317 / 077 9334211-2



එකමත් එක සීයා කෙනෙක් තම යහපත් බිරිඳ සමග
තද නිල්වන් මුහුදක වෙරළේ දිවි ගෙව්වා.
කටුමැටි ගැසූ පැල් කොටයක අවුරුදු තිස්තුනක් විතර
ඒ දෙන්නා සංතෝසෙන් වාසය කෙරුවා.
දැල් දාලා මාළු අල්ල ගන්න එකයි සීයා කළේ.
ඔහුගේ යහපත් බිරින්දෑ නූල් කටින එකයි කළේ.
දවසක් දා ඒ සීයා මහ මුහුදේ දැල් දාලා
ගොඩට ඇදල ගත් විට පෙඳ පාසියි තිබුණේ.
නැවත වරක් ඔහු ඒ දැල මහ මුහුදට එලුව විටදි
මුහුදු පැළෑටිත් සමගයි වෙරළට ආවේ.
තුන්වන වරටත් සීයා ඒ දැල මුහුදේ එලුවා.
ගොඩට ඇද්ද විට එය තුළ එක ම මාළුවෙක් සිටියා.
සුපුරුදු මාළුවෙක් නොවෙයි,
ඌ රන්වන් මාළුවෙක් ය.
ඒ රන් මාළුව ඔහුගෙන් අනුකම්පාවක් යදිමින්
මිනිස් කටහඬක් අරගෙන මෙන්න මෙහෙම කතා කළා.

''අනේ සීයෙ මා ගෙන ගොස් මහ සයුරට දමාපන්කො.
ඒ වෙනුවට මම වටිනා වන්දියකුත් ගෙවන්නම්කො.
ඔබ පතනා ඕන දෙයක් ඉටු කරවා දෙවන්නම්කො''

එය අහලා හොඳටම පුදුමව සීයා ගල් ගැසුණා.
තිස්තුන් වසරක් තිස්සේ මාළු අල්ලමින් සිටියත්
කතා කරන මාළුවො ඔහු කිසි දවසක දැකලා නෑ.

රන් මාළුවාව දෑලෙන් මුදාලා
මුදු පිය වදනින් උෟ අමතාලා
සීයා මේ ලෙස පැවසූවා.

''රත්තරන් මාළුවේ, රත්තරන් මාළුවේ
දැන් ඉතින් සැනසිල්ලෙ වසන තැනකට යන්න.
ඕන නෑ ඕන නෑ මට වන්දියක් දෙන්න.
තද නීල වර්ණ සාගරය වෙත යළි යන්න
පීනමින් සිතූ සේ දිය කෙළියෙ නියැලෙන්න''.

සීයා යළි නිවසට ගොස් යහපත් බිරිඳව හමු විය
ඒ මහ පුදුමය පිළිබඳ තොරතුරු ඇය හට හෙළි විය
''අද මාගේ දැලට අරුම පුදුම මාළුවෙකු හමු විය
ඒ රන් මාළුවා අපේ බසින් කතා කෙරුමට විය
සාගරයට මුදා හරින ලෙස මට පිංසෙන්ඩු වුණා
ඒ වෙනුවෙන් මාහැඟි වන්දියක් දෙන්න එකඟ වුණා
වන්දි ගන්න නෑ එකඟ වුණේ මම
උෟ සයුරට විසි කෙරුවා මේ මම''



බිරින්දෑ සැමියට බනින්න ගත්තා
''හරිම මෝඩ කතකීරුවෙකුනේ උඹ
මාළුවෙකුගෙ ඇවිටිල්ලට දුන් ඉඩ
බලනව අපෙ රෙදි හෝදන බේසම
මැද්දෙන් පුපුරා ගොස් ඇති අන්දම
මේකෙන් රෙදි හෝදන්නේ කොහොම ද ?
අලුත් බේසමක් වත් අඩු ගණනේ
ඉල්ලා ගන්නට තිබුණා නොවැ අද ?''

සීයා යළි තද නිල් පැහැ සයුරට
පිය මැන්නා කරදරයෙන් මිදුමට
සයුර කෝප වීලා මෙන් පෙනුණට
මහා හඬින් කෑ ගැසුවා මසු හට

රන් මසු පිහිනා ආවා හනිකට
ඉන් පසු පැවසුවා මේ විලසට

''මොකද සීයෙ මේ යළි ආවේ ඔබ
කියන්න කියන්න බය වෙන්නේ කිම ?''

''මාළුන්ගේ රජතුමනි, මට කරුණා කළ මැනවි.
මගෙ යහපත් බිරින්දෑ අද මාත් සමග කෝප වෙලා
අලුත් බේසමක් රෙදි සෝදා ගන්නට ඕන වෙලා
පැරණි බේසමත් හරියට මැද්දෙන් පුපුරා ගිහින්ලු''

''ඕක ගණන් ගන්න එපා
සීයා බය වෙන්න එපා
හිමින් සැරේ ගෙදර යන්න
අලුත් ම බේසමක් ගෙදර තියෙයි ඔන්න''



තම යහපත් බිරිඳ වෙතට
සීයා ගැටුව හෙමිහිට
අලුත් ම බේසමක් පැලට ඇවිත් තිබෙනවා දුටුවිට
ඇය වෙනදට වඩා සැරෙන් සැරවැර කෙරුවා හිමි හට

''නාකි මෝඩ තකතීරුවා''
වෙන කවදාටත් වැඩියෙන් ඈ ඔහු හට බැන වැදුණා
''මහ ලොකු කෙංගෙඩියක් ඔය ඉල්ලා ගෙන ඇවිත් ඉන්නෙ
රෙදි හෝදන බේසමකින් කොහොම ද වාසියක් වෙන්නෙ
මෝඩය, ආපසු පලයන් 'මහ ලොකු මාළුවා' වෙතට
ගිහින් ඉල්ල ගනින් එයාගෙන් මහ මැදුරක් අප හට

සීයා නැවතත් පිය මැන්නා තද නිල් සයුර වෙතට
සයුරත් අන්දකාර විය දුක් කරදර ආ විලසට
අවදි කරල කට හඬ ඔහු කෑ ගැසුවා මාළුව හට
පිහිනා ගෙන ආවා රත්තරන් මාළුවා හනිකට

''මොක ද සීයෙ වුණේ මගේ ළඟට ඇවිත් කියන්නකෝ''
''කරුණාබර මාළු රජුනි මට පිහිටක් දෙවන්නකෝ
මගෙ යහපත් බිරිඳ තව තවත් වැඩියෙන් කෝප වෙලා
මට කිසි සැනසිල්ලක් නැහැ ඇගෙ කරදර තියුණු වෙලා





මේ වයසක උන්දෑ හට සෑහීමක් ඇත්තේ නෑ
මහ මැදුරක් ඕන කියල දූන් මට බේරිල්ලක් නෑ''

රන්වන් මාළුවා එබස් නිහඬව අහගෙන උන්නා
ඉන්පසු අසරණ සීයට මේ ලෙස පිළිතුරු දුන්නා
''ගණන් ගන්න එපා සීයෙ සැනසිල්ලේ ගෙදර යන්න
ඔබේ පැතුම ඉටු වේවී
මහ මැදුරක් හිමි වේවී''
තමන්ගෙ පැල් කොටය තිබුණ තැනට සීය යළි ආවා
එහි කිසි සලකුණක් නොමැත ලස්සන මැදුරක් වූවා
සුදු හුණු ගෑ සුදෙන් දිලෙන ඒ මැදුරට
ගඩොලින් කළ ඉහළට නැගි හොඳ දුම් කවුලුවක් වීය
තේක්ක ලීයෙන් නිම වුණ අගනා දොර ජනෙල් වීය
සඳළුතලේ ඉදිරියෙන් ම අලංකාර ලෙස නිම වුණු
කැටයම් කළ ලීයෙන් තැනූ අපූරු කවුළුවක් වීය
මැදුර ඉදිරියෙ උයන් අසුනක වාඩි වීලා බලා උන්නේ
කෝපයෙන් පිපිරෙමින් ඉන්නා ඔහුගෙ යහපත් බිරිඳ වන්නේ

''අනේ අනේ තමුසෙ වගේ අමන මෝඩ තකතිරුවෙක්.
එතකොට මහ ලොකු වරයක් !
බාල කබල් මන්දිරයක්
ආපසු යනවා හනිකට මහ ලොකු මාළුවා වෙතට
වැඳ වැටිලා හරි එයාට ඉල්ලා සිටිනව හනිකට
කුමාරිහාමියක් බවට මා පත් කරලා දෙන්නට
මට නම් බෑ තව දුරටත් පිටිසර ගෑනියක් වෙන්ට''

සියුර වෙතට සීයා පිය මැන්නා
සයුර සිටී රළු සැඩ ගති පෙන්නා
තම මිතුරා කැඳවා හඬ දුන්නා
රන් මසු පිහිනා වෙරළට එන්නා

''මොකද සීයෙ වුණේ
ඇවිත් කියනු මැනේ''



ගරුසරු ලෙස පහත් වෙලා සීයා පිළිතුරු දුන්නා.
''මාළුන්ගේ රජතුමනි,
මට කරුණා කළ මැනවි
මගෙ යහපත් බිරින්ද දූන්
වෙන කවදාකටත් වඩා
මුරණ්ඩු බව පෙන්වන්නේ.
කිසි සැනසීමක් නෑ මට
ඇ නිති බැන වදිනා විට.
දූන් ඇයගේ කල්පනාව
වලව් පෙලපතක ඉපදුණු
කුමාරිහාමියක් වෙන්න''

රන්වන් මාළුවා එබස් නිහඬව අහගෙන උන්නා
ඉන්පසු අසරණ සීයට මේ ලෙස පිළිතුරු දුන්නා

තම යහපත් බිරිඳ වෙතට සීයා නැවතත් ආවා
අලංකාර මන්දිරයේ දසුන නෙතට හමුවූවා
පියැසි දොරටුවේ අබියස ඇය ඉන්නා හැටි දුටුවා
හොඳට ම පුදුමයට පත් ව ඔහු තම නෙත් පිස දැමුවා



කළු පාට මුගටි සම් පටි රේන්දෙට යෙදූ
බෝරිච්චි අත් යොදා අගනා ලෙසින් මැසූ
හැට්ටෙකින් සහ සායකින් සැරසිලා සිටි.

සොඳුරු මුතු මාලයක් කර වටා දවටිලා
රත්තරන් මුදුවලින් අතැඟිලි ද සැරසිලා
හැඩැති මුදු පාවහන් පයට එළියක් වෙලා
සීයාට තම දෙනෙත් අදහන්න බැරි වෙලා.

ළඟට ගිහින් සේවකයෝ
බියගුලු ලෙස හිස නමලා ආචාරය පුද කෙරුවා.

ඇය ඔවුනගෙ කෙස්සෙන් ඇද හොඳට ම හිරිහැර කෙරුවා

සීයා බය පක්ෂපාත විලසට යහපත් බිරිඳට
මෙන්න මෙහෙම ඇමතුවා ගරු කටයුතු විලාසයට

''කොහොමද දැන් ඉතින් ඔබට මගේ ආර්යාවනී
නිවිල නේද හදවත සැහීමට පත්වීමෙනි''

යහපත් බිරිඳගේ පිළිගැනීම ඔහුට දරුණු වුණා
ඇගෙ ඉස්තාලයේ වැඩට පිටත් කෙරුම සිද්ධ වුණා

සතියක් ගෙවුණා තව සතියක් ගෙවුණා
බිරින්දෑගෙ මුරණ්ඩු බව තව තව වැඩුණා
කරුණාවක් ගැවීවත් නැති බව පෙනුණා
සීයව නැවතත් පෙර සේ සයුරට යැවුණා





''පලයන් නැවතත් මහ ලොකු මාළුව ළඟට ගිහින් වැඳපන්
තවදුරටත් මම කුමාරිහාමී කෙනෙක් නොවෙයි කියපන්
ඉක්මන් කරලා අධිරාජිනියක් කරන්නටෙයි කියපන්
හොඳට ම බියපත් වූ සීයගෙ සිත, කිව්වෙ 'වාද කරපන්'

''මොකදෑ ගෑනියෙ වෙලා තියෙන්නේ උඹට පිස්සු හැදිලා
කියවීමෙන්, ඇවිදීමෙන් හරියට මාළු වෙළෙන්දි වෙලා
උඹ නවතින්නේ උඹෙ අධිරාජ්ජෙ හොඳට හිනස්සවලා''

මේ ටික ඇහුව ම යහපත් බිරිඳගෙ යකා ඇවිස්සිලා
සැමියට කම්මුල් පහරක් ගහලා ඈ හොඳට ම කෑ මොර දුන්නා

''කොහොම ද උඹ කිසි බයක් නැතිව ගොයියෝ මා හා වාදෙට එන්නේ
ලොකුම වලව් පෙළපතකින් පැවතෙන මම හොඳ ආර්යාවක් වන්නේ
උඹ දැන් මුහුදට යනව ද නැද්දැයි ඉක්මන් කරලා කියපන්නේ
එහෙම නොවුණහොත් මම උඹ කුදලා වෙරළට කැඳවාගෙන යන්නේ''

සීයුර වෙතට සීයා පිය මැන්නා
එය කළු වී තර්ජනය කරන්නා
ඔහු උස් හඬකින් මසු කැඳවන්නා
රන් මසු පිහිනා වෙරළට එන්නා



''මොකද සීයෙ වුණේ
ඇවිත් කියනු මැනේ''

දෙකට නැමී ආචාරය පුදකර
සීයා කීවා පිළිතුරු ගොනුකර
''මාළුන්ගේ රජතුමනී, මට කරුණා කළ මැනවී
මගේ බිරින්දෑ නැවතත් වියරු වෙලා දඟලන්නී
කුමාරිහාමියක් නොවෙයි මහරාජිනියක් වෙනවා
කියල හිතාගෙන ඒකත් කරව ගන්න වද දෙන්නී''

''ගණන් ගන්න එපා සීයෙ සැනසිල්ලේ ගෙදර යන්න
ඔබෙ යහපත් බිරින්දෑ මහරාජිනියක් වේ ය ඔන්න''

තම යහපත් බිරිඳ වෙතට සීයා පැමිණියා ඔන්න
ඔහු දුටුවේ කුමක් ද හැකි වේවි ද ඔබ හට හිතන්න
රන්වන් මාළුවාගේ පිහිටෙන් ඇය ගැන හොඳට දන්න
දබරෙට බර ඒ මැහැල්ල, රජ මැදුරක වසයි ඔන්න



ඈ රජ මේසය ළඟ වාඩි වී රුවට සිටිනවා
මැති ඇමතියො ඇගෙ සේවය සඳහා ළඟ සිටිනවා
කොණ්ඩ කැවුම් ගෙඩියක් ගෙන රස හෙමිහිට විඳිනවා
රන් කුසලානයක වයින් ඇය වෙත පිරිනැමෙනවා
දැඩි ගති ඇති මුර සෙබළුන් ඇය වට මුර කරනවා
ඔවුන් එකිනෙකාගේ අත තඩි පොරවක් තියෙනවා

සීයා එක බැල්මයි හෙළුවේ දණහිස් වෙව්ලුණා
ඇය ඉදිරියෙ නැවෙන්න ගිය ඔහු බිමට ම පෙරළුණා
එනමුදු ඔහුගේ මුවගින් මෙවදන් පෙළ කියැවුණා
''බියකරු මහරාජිනියෙනි වැජඹේවා සතුටිනා
මෙපමණ දවසක් ඔබ හට ලද දේවල් ඇති වුණා ද?
කියන්න මට දැන්වත් ''හද සැහීමට පත් වුණා ද?''

යහපත් බිරිඳගෙන් එක ම බැල්මක් වත් හෙලුණෙ නෑ
ඔහු ඉවතට ගෙන යෑමට අණකර සිටියා ය ඈ
රාජ සභාවේ ඇත්තෝ සීයා වෙත දිව ගියා
ඔහුගේ බෙල්ලෙන් අල්ලාගෙන එළියට ගෙන ගියා
දොරකඩ සිටි මුර සෙබළුන් ඔහු ගෙන යන හැටි දුටුවා
රජ වාසළ සිටි මිනිසුන් හොඳට ම හක හක ගෑවා

''නාකියාට හොඳ පාඩම
අනාගතේ උඹෙ ඉරණම කියලා දෙන හොඳ පාඩම
ඕක තමයි මෝඩ අමන නාකියෝ''
කියමින් අපහාස කළා.

සතියක් ගෙවුණා තව සතියක් ගෙවුණා
නාකි ගෑනි තව සම්පත්වලට ගිජු වුණා
සීයව ගෙන එන්න රාජ පුරුෂයො යැවුණා
ඔවුන් ඔහුව රාජ සභාවට කැඳවාගෙන ආවා
සැමියා හට යහපත් බිරිඳගෙන් මෙ අණ පිට වූවා

''යළිත් මාළු රජු වෙත ගොස් යටහත් ලෙස වැඳ වැටිලා
කියපන් මම තවදුරටත් මහරජිනක් නොවෙයි කියා
එහෙත් මමයි සයුරු මුහුදු පාලකයා
ඒවායේ පත්ල තෙක් ම මගේ බලය විහිදෙනවා
රන්වන් මාළුවත් එවිට මට සේවය කළ යුතු වේ
මගෙ කටයුතුවලට එයා එහෙ මෙහෙ පිහිනිය යුතු වේ''

ඇයට විරුද්ධව කට හොල්ලන්ට සීයා බිය විය
ඇයට විරුද්ධව කටයුතු කරන්නටත් ඔහු බිය විය

නැවතත් ඔහු සාගරයේ වෙරළ දෙසට පිය නැගුවා
කළු පැහැයෙන් කුණාටුවක් මතු වී එනවා දුටුවා
කෝප වූ රළි ඔහු අසලට ළඟා වුණේ මුදුන් වෙවී
එකට සැලී එකට සුලී නංවාගෙන මහ හඬ දී
එහෙත් සීය කෑ ගැහුවා මිතුරා හට වෙරළට වී

රන් මසු විගසින් පිහිනාගෙන ආවා
මොකද සීයෙ වූයේ යයි විමසූවා
යටහත් ලෙස සීයා පිළිතුරු දුන්නා රන් මසු හට
''මාළුන්ගේ රජතුමනී මට කරුණා කළ මැනවී.
මේ ගෑනිත් එක්ක දෙයියනේ මම මොනවා කරම් ද?
මෝඩ ගෑනි තවදුරටත් මහරාජිනියක් නොවේලු
සාගර සහ මුහුදු පාලනය ඇය හට උරුම වේලු
ඇගේ බලකොටුව වනු ඇත්තේ ගැඹුරැති පෙදෙස්ලු
එවිට ඔබට ඇය හට සේවය කර ඉන්නටත් වේලු
පණිවුඩ එහෙ මෙහෙ ගෙනියන්නට පිහිනන්නටත් වෙවි''

රන්වන් මාළුවා කිසිවක් නොකියා ම
වලිගය ගස්සලා පිහිනුවෙ ගැඹුරට ම



වෙරළට වෙලා සීයා බල බල සිටියා
මාළුවගෙන් පිළිතුරු ලැබුණේ නැතිවා
අන්තිමේ දී සීයා යහපත් බිරිඳව සොයා ගියා.

අහා! මහා පුදුමෙකි.
කටුමැටි ගෙයි එළිපත්තේ වාඩි වෙලා ඇය සිටී
කැඩිච්ච රෙදි සෝදන බේසම ඇය ඉදිරියෙ සිටී





ඇලෙක්සැන්ඩර් පුෂ්කින්

# මසුන් මරන්නා සහ රත්තරන් මාළුවා



ප්‍රකාශනය

**කුරුළු පොත් ප්‍රකාශකයෝ**

594/1, නාවල පාර, රාජගිරිය.

දුර : 011 2863350/071 8263828

ISBN 978-955-591-271-6

9 789555 912716

මිල රු: 200/-